# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,634 - 2009 දෙසැම්බර් මස 24 වැනි බ්‍රහස්පතින්දා - 2009.12.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 1890 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1893 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියළුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 ජනවාරි මස 01 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2009 දෙසැම්බර් මස 18 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතුය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරින් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලකදී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත් දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරින්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරින්ට අදාළ සේවා කොන්දේසි :**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වන වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලටද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලුම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලුම රාජ්‍ය නිලධාරිහූ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරින්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීනතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකිය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාල සීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරින්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැළසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්විමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකිය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නාවූද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි :**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරින් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරින් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේය. මුදල් වර්ෂය අවසානයේදී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නාවූ නිලධාරින් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නාවූ නිලධාරින් හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදලා හරිණු ලැබූ යුද්, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාව යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාල සීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව ඇත්ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතුය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය :**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේව මුක්ත භටයින් ද, සහය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයටද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම්ද, ඔවුන්ගේ එස සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම්ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වූ කාල සීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරිහු :**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරින් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූ ද, නිලධාරින්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකිද යන්න එම නිලධාරින් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කළින් දැනට ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත් තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම :**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය :**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියළුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලුම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඩුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ.

i. මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසට හෝ පෙනී සිටීම හෝ තහනම් කිරීම.
ii. විභාගයේ එක් විෂයයකට හෝ මුලු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
iii. එක් අවුරුදු හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
iv. මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
v. සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
vi. විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වග කිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයාගේ පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුරු හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදි වුවත් එවැනි විභාගපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටතේ වන්නේය.

1. සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසළදීත් විභාගශාලාධිපතින්ට ද, ඔහුගේ සහාකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවුවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුලු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දි විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීම් ආදියත් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සළකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුය. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේදී ලියන ලද කියන

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමක් චිත්‍ර කර්මයේදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සළකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදි උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැළකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොල හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොත් පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සළකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොලයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම හොර උත්තර ලීවීමට ද, යත්න දැරීම තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකුට ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාව යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකයේ වෙනස් කිරීමක් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සළකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

i. විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටතේ පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

ii. යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතු විය හැකිය.

iii. විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්නට දන්වා විභාග අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

iv. විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්, ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේදී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුසණක චක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

v. විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑළි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

vi. තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

vii. උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තිරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

viii. අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

ix. ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදීත් ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

x. එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

xi. ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකණු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

xii. යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විටද කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

# තනතුරු - ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — ගම්පහ දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාස තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

03. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකිය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 21 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 65 ට වැඩි නොවිය යුතු ය.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2010 පෙබරවාරි මස 01 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මඟින් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2009 දෙසැම්බර් මස 09 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| ගම්පහ | ගම්පහ | පමුණුගම කොට්ඨාසයේ උප්පැන්න මරණ හා දකුණු අළුත්කුරු කෝරළයේ විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ගම්පහ |

12-823

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — කොළඹ දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාස තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

03. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකිය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 21 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 65 ට වැඩි නොවිය යුතු ය.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2010 පෙබරවාරි මස 01 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මඟින් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2009 දෙසැම්බර් මස 9 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| කොළඹ | කොළඹ | අළුත්කඩේ කොට්ඨාසයේ උප්පැන්න හා මරණ වෛද්‍ය රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වේල්ලවීදිය, කොළඹ 12. |
| කොළඹ | කොළඹ | නිව් බසාර් කොට්ඨාසයේ උප්පැන්න හා මරණ වෛද්‍ය රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වේල්ලවීදිය, කොළඹ 12. |

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය |
|---|---|---|---|---|---|---|---|
| කොළඹ | කොළඹ | මරදාන කොට්ඨාසයේ උප්පැන්න හා මරණ වෛද්‍ය රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වේල්ලවීදිය, කොළඹ 12. | කොළඹ | තිඹිරිගස්යාය | වැල්ලවත්ත කොට්ඨාසයේ උප්පැන්න හා මරණ වෛද්‍ය රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වේල්ලවීදිය, කොළඹ 12. |

12-824

---

**ජනසභා ලේකම් තනතුරට උපාධිධාරීන් බඳවා ගැනීම**

ඉහත තනතුර සඳහා බඳවා ගැනීමට 2009.11.20 දින පළවූ ගැසට් නිවේදනයේ අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2009.12.30 දක්වා දීර්ඝ කරනු ලැබේ.

ඩබ්. කේ. කේ. කුමාරසිරි,
ලේකම්,
ජාතිය ගොඩනැගීමේ හා
වතු යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අමාත්‍යාංශය.

12-886

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**

ඉස්ලාම් ආගමික අහදිය්‍යා අල් කුර්ආන් පාසල් සඳහා වූ අවසන් සහතික පත්‍ර විභාගය - 2009

(බෞද්ධ දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය හා සමාන විභාගයකි.)

නීති රීති හා ව්‍යවස්ථා :

1. විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ඉහත සඳහන් විභාගය, 2010 මාර්තු මාසය තුළ පැවැත්වීමට කටයුතු යොදා ඇත. එම විභාගය සඳහා වූ විෂය නිර්දේශ, ඇමුණුම 01 හි සඳහන් වේ.

2. විභාග මධ්‍යස්ථාන :

එක් එක් දිස්ත්‍රික්කයෙන් පෙනී සිටීමට නියමිත අයදුම්කරුවන්ගේ සංඛ්‍යාව අනුව ඇමුණුම 02හි සඳහන් නගරවල විභාග මධ්‍යස්ථාන පිහිටුවනු ලැබේ.

එහෙත් යම්කිසි විභාග මධ්‍යස්ථානයකට ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති වුවහොත් එම මධ්‍යස්ථාන අවලංගු කර එම අයදුම්කරුවන් ඊට ආසන්න වෙනත් විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කරනු ලැබේ.

3. භාෂා මාධ්‍යය :
මෙම විභාගය දෙමළ, සිංහල සහ ඉංග්‍රීසි භාෂා මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ.

4. සුදුසුකම් :
මෙම විභාගය සඳහා අයදුම්කරන සෑම අයදුම්කරුවකුම පහත සඳහන් සුදුසුකම්වලින් එකක් හෝ සම්පූර්ණ කර තිබිය යුතුය.

4.1 මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලද අහදිය්‍යා දහම් පාසලක 10 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන අයකු වීම

හෝ

4.2 මුස්ලිම් ආගමික හෝ සංස්කෘතික දෙපාර්තමේන්තුවෙන් අනුමත කරන ලද අල්කුර් ආන් මද්රසා විෂය නිර්දේශය සම්පූර්ණ කරන ලද අයකු වීම.

හෝ

4.3 ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන අ. පො. ස. (සා. පෙළ) විභාගයේ ඉස්ලාම්, අරාබි විෂයන්ගෙන් සාමාර්ථ්‍යය ලත් අයකු වීම.

සටහන :

1. මෙම විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවකු ම ඉහත 4 වැනි ඡේදයේ සඳහන් කර ඇති සුදුසුකම් ලබා ඇති බවට අහදිය්‍යා දහම් පාසලේ විදුහල්පති හෝ අල්කුර් ආන් මද්රසාවේ ජ්‍යෝෂ්ඨ විදුහල්පති හෝ පාසලේ විදුහල්පති හෝ සහතික කළ යුතු වේ.

2. සෑම අයදුම්කරුවකු ම මෙම විභාගයට ලියාපදිංචි කළ අහදිය්‍යා පාසල හෝ ජ්‍යෝෂ්ඨ අල් කුර්ආන් මද්රසාවේ හෝ පාසලේ විදුහල්පති හෝ මගින් පමණක් ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතුවේ.

5. ලියාපදිංචි කළ සියලු ම අහදිය්‍යා දහම් පාසල්, මද්රසා පාසල් වෙත ඉල්ලුම්පත් හා උපදෙස් පත්‍රිකා තැපැල් මගින් යවා ඇති අතර, එසේ නොලැබුණු ආයතන වෙතොත් විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයට අයදුම්කරුවන් සංඛ්‍යාව සඳහන් කළ

ලිපියක් 2010.01.08 දිනට පෙර එවීමෙන් අයදුම්පත්‍ර හා උපදෙස් පත්‍රිකා ලබාගත හැක.

5.1 සියලුම ඉල්ලුම්පත් පිටපත් දෙකකින් යුතුව සකස් කර මුල් පිටපත විභාග දෙපාර්තමේන්තුව වෙත එවිය යුතු අතර, අනෙක් පිටපත අදාළ ආයතනයේ ගොනුකර තැබිය යුතුය.

5.2 ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනය 2010.01.22 වැනි දින වේ.

5.3 ඉල්ලුම්පත් පැහැදිලි ව හා නිවැරදිව සම්පූර්ණ කළයුතු වේ. එසේ නොවන ඉල්ලුම්පත් හා අවසාන දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5.4 සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට එවිය යුතු වේ.
විභාග කොමසාරිස් ජනරාල්,
(සංවිධාන හා විදේශ විභාග ශාඛාව),
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

5.5 ඉල්ලුම්පත් ලැබුණු බව දැනුම් දෙනු නොලැබේ.

5.6 ඉල්ලුම්පත් බහා එවනු ලබන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ " ඉස්ලාම් ආගමික අහදිය්‍යා අවසාන සහතික පත්‍ර විභාගය - 2009" යනුවෙන් හා ඉල්ලුම් කරන විභාග මධ්‍යස්ථානය ද සඳහන් කළ යුතුය.

5.7 ඉල්ලුම්පත්‍ර සමග කිසිදු සහතිකයක් අමුණා එවිය යුතු නැත. අහදිය්‍යා දහම් පාසලේ හෝ මද්රසාවේ විදුහල්පති හෝ පාසලේ විදුහල්පති හෝ ඉල්ලුම්කරු/ඉල්ලුම්කාරිය නියමිත සුදුසුකම් ලබා ඇති බව සහතික කළ යුතුය.

6. පළමුවන වරට මෙම විභාගයට පෙනී සිටින අයගෙන් විභාග ගාස්තු අයකරනු නොලැබේ. පළමුවන වරට පසු පෙනී සිටින අයදුම්කරුවන් විභාග ගාස්තු වශයෙන් රුපියල් 100 ක් ගෙවිය යුතුය. ඌන සාමාර්ථ්‍යය සම්පූර්ණ කිරීම සඳහා වන විෂයයට රුපියල් 50 ක විභාග ගාස්තුවක් ගෙවිය යුතුය.

විභාග ගාස්තු ගෙවන ආකාරය ඃ

නියමිත මුදල තැපැල් කාර්යාලයට ගෙවා ලබා ගන්නා ලද ලදුපත ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුය. (ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

7. ප්‍රවේශ පත්‍ර :
විභාග කොමසාරිස් ජනරාල් විසින් අදාළ අහදිය්‍යා විදුහල්පති වෙත හෝ මද්රසා විදුහල්පති වෙත හෝ පාසලේ විදුහල්පති වෙත හෝ විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ.

7.1 යම්කිසි විභාග අයදුම්කරුවකු විභාගයට පෙනී සිටින පළමුවන දිනයේ තම අත්සන සහතික කරවාගත් විභාග ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් හෝ විභාග කොමසාරිස් ජනරාල් විසින් නියම කරන ලද විභාග මධ්‍යස්ථානය හැර වෙනත් මධ්‍යස්ථානයක විභාගයට පෙනී සිටීමට තැත් කළහොත් අදාළ අයදුම්කරුගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

7.2 ප්‍රවේශ පත්‍රයේ ඇති ඉල්ලුම්කරුගේ අත්සන අහදිය්‍යා දහම් පාසලේ විදුහල්පති හෝ මද්රසා විදුහල්පති හෝ අරාබි විදුහලේ විදුහල්පති හෝ රජයේ සේවයේ යෙදී සිටින රුපියල් 237,060 කට වඩා වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන ස්ථිර රජයේ නිලධාරියකු හෝ මස්ජිද් භාර ඉමාම් යන අයගෙන් කෙනකු හෝ විසින් සහතික කළ යුතුය.

7.3 විභාගය පැවැත්වීමට දින හත (07) කට පෙර ප්‍රවේශ පත්‍ර නොලැබුණහොත් ඉල්ලුම්පත් ඉදිරිපත් කළ අහදිය්‍යා පාසල්වල හෝ මද්රසා පාසල්වල විදුහල්පතිවරු මේ පිළිබඳව විභාග කොමසාරිස් ජනරාල් වෙත දැනුම් දිය යුතුය. එවැනි සෑම අවස්ථාවක දී ම පහත සඳහන් කරුණු දැනුම් දිය යුතුය.

(අ) විභාගයේ නම
(ආ) අහදිය්‍යා පාසල්/කුර්ආන් මද්රාසා/රජයේ පාසලේ නම
(ඇ) සම්පූර්ණ නම හා ලිපිනය
(ඈ) ඉල්ලුම් කළ විභාග මධ්‍යස්ථානය
(ඉ) ඉල්ලුම් පත්‍රය යැවූ තැපැල් කාර්යාලය
(ඊ) ලියාපදිංචි කළ දිනය හා අංකය

8. අනන්‍යතාව තහවුරු කිරීම
සියලු ම අයදුම්කරුවන් විභාගයට පෙනී සිටින සෑම අවස්ථාවක දීම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන ආකාරයට තමන්ගේ අනන්‍යතාව ඔප්පු කළ යුතුය.

9. විභාග ප්‍රතිඵල නිකුත් කිරීම හා සමත් බව සහතික කිරීම :

9.1 මෙම විභාගය සඳහා නියමිත විෂයන් ගණන හතරක් වන අතර, විභාගයෙන් සාමාර්ථ්‍යය ලැබීම සඳහා සෑම විභාග අපේක්ෂකයකු ම එම විෂයන් හතරෙන් ම සමත් විය යුතුය. කෙසේ වෙතත් එක් වතාවකදී අදාළ විෂය හතරෙන් එක් විෂයයක් පමණක් අසමත් නම් ඌන සාමාර්ථ්‍යයක් ලෙස සලකනු ලැබේ. විභාගයේ ප්‍රතිඵල නිකුත් කළ දින සිට අනුගාමී වසර තුනක් (03) ඇතුළත එම ඌන සාමාර්ථ්‍යය ලැබූ විෂයය සඳහා නැවත පෙනී සිට, එය සමත් වී, ඌන සාමාර්ථ්‍යය සම්පූර්ණ කළ හැකිය. (මෙය 2007 වසරේ සිට බලපැවැත්වේ.)

9.2 විභාග ප්‍රතිඵල නිකුත් කිරීම :
විභාග ප්‍රතිඵල පිළිබඳ විස්තර අදාළ ආයතන ප්‍රධානීන් වෙත තැපැල් මගින් දන්වා යවනු ලැබේ.

10. සහතික පත්‍ර :
විභාගයෙන් සාමාර්ථ්‍යය ලබන සියලුම අයදුම්කරුවන්ට සහතික පත්‍ර නිකුත් කරනු ලැබේ.

11. ප්‍රතිඵල නැවත සමීක්ෂණය :
විභාග ප්‍රතිඵල නිකුත් වී දින 30ක් ඇතුළත ප්‍රතිඵල නැවත සමීක්ෂණය සඳහා ඉල්ලුම් කළහැකිය. විභාග දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන ආකෘති පත්‍රයක් මගින්, නියමිත ගාස්තු ගෙවා අදාළ ආයතනයේ විදුහල්පති මගින් ඒ සඳහා ඉල්ලුම් කළ යුතුය. විභාග ප්‍රතිඵලවල වෙනසක් සිදුවුවහොත් පමණක් ගාස්තු ආපසු ගෙවනු ලැබේ. කවර හෝ හේතුවක් මත ඉල්ලුම්කරුට හෝ ඔහුගේ/ඇයගේ නියෝජිතයකුට හෝ උත්තර පත්‍ර නිරීක්ෂණයට අවසර දෙනු නොලැබේ.

12. ඉහත සඳහන් කොන්දේසි හා උපදෙස්වලට අනුකූලව කටයුතු කිරීමට සියලු ම අයදුම්කරුවන් බැඳී සිටින අතර, මෙහි සඳහන් නොවූ කරුණු සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි තීරණ ගනු ලැබේ.

අනුර එදිරිසිංහ,
විභාග කොමසාරිස් ජනරාල්.

2009 දෙසැම්බර් මස 08 වැනි දින,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

ඇමුණුම - 01

**විභාග සඳහා වූ විෂයයන් හා විෂය නිර්දේශ**

මෙම විභාගයට අයත් එක් එක් ප්‍රශ්න පත්‍රයක් පැය තුනක කාලයක් සඳහා සකස් වූ ප්‍රශ්න පත්‍ර වන අතර එවැනි ප්‍රශ්න පත්‍ර හතරක් විභාගයට අයත් වේ.

*පළමුවන ප්‍රශ්න පත්‍රය :*

1. අකීදා සහ ෂරීආ (ඉස්ලාම් සිද්ධාන්ත හා මූලිකාංග) :

1.1 අකීදා පොදු පැහැදිලි කිරීම් (අල් ඉලාහියියාත්, අන්නුබුව්වත්, අර්රූහානියත්, අස්සම් ඉය්යාත්)

1..2 අකීදාවේ කොටස් :
+ අහුලුස්සුන්න වල්ජමා අත්හි අකීදා
+ අනිකුත් අකීදා කොටස් කිහිපයක් ජබරිය්යා, කදිරිය්යා, මුර්ජියා, මු:තජිලා, ෂියා

1.3 තෞහිද් හා ෂිර්ක්කු :
+ ඊමාන් හා කුප්රු
+ රිද්දත්, නිපාක්
+ අල්කුරාණය පහල කර එය සම්පාදනය කරන ලද ආකාරය පිළිබඳ ඉතිහාසය
+ නීති මූලධර්මයන් වශයෙන් අල්කුරාණයේ උපයෝජනය
+ සුන්නාවේ බිහිවීම හා එය සම්පාදනය කළ ඉතිහාසය
+ නෛතික මූලධර්ම වශයෙන් සුන්නාවේ උපයෝජනය
+ හදීස් කලා ඉතිහාසය හා ප්‍රධාන මුහද්දීස්වරුන්ගේ දායකත්වය
+ ඉජ්තිහාද් පිළිබඳ විස්තර
+ ආධාරක මූලධර්මයන් වශයෙන් ඉජ්මා
+ ආධාරක මූලධර්මයන් වශයෙන් කියාස්
+ පික්හයේ ඉතිහාසය හා ප්‍රධාන ඉමාම්වරු

1.4 අරාබි භාෂාව :
+ හැඩහුරු සහිතව ලිවීම
+ කුඩා වාක්‍යයන් ලිවීම
+ ඉස්ලාම් විෂයට අදාල අරාබි වචන ලිවීම
+ ප්‍රධාන සූරා, ආයත්, හදීස් ආදිය නිවැරදිව ලිවීම

*දෙවන ප්‍රශ්න පත්‍රය :*

2. අල්ෂික්හුල් ඉස්ලාම් නීති පද්ධතිය :

2.1 ඉබාදත් පිළිබඳ විස්තර :
- ඉබාදතයේ කොටස්
- තහාරත්

2.2 නජිසය හා එහි කොටස් :
- නජිසය පිරිසිදු කිරීමේ ක්‍රම
- ජලය හා එහි වර්ග
- වුලු, තයම්මුම්, ස්නානය පිළිබඳ පවතින ක්‍රියාදාමයන්

2.3 සකාත් :
+ වැදගත්කම
+ විධි හා ක්‍රම
+ එක්රුස් කිරීම හා බෙදා හැරීම

2.4 නෝම්බිය (උපවාසය) :
+ වැදගත්කම
+ විධි ක්‍රම හා ප්‍රයෝජනය

2.5 හජ් :
+ වැදගත්කම
+ විධි ක්‍රම හා ප්‍රයෝජන

2.6 හජ් ඉටු කරන ක්‍රමය :
+ පර්ලු වාජිබ් සුන්නත්
+ පර්ලු හජ් යට අමතරව ඉටුකරන හජ්

2.7 ඉස්ලාම්හි ආහාර, ඇඳුම්, වාසස්ථාන පිළිබඳ අවධානය හා ක්‍රියාදාම

2.8 ප්‍රගාත් පිළිබඳ පැහැදිලි කිරීම

2.9 කුර්බානි හා කැපුම් ක්‍රමයන්

2.10 දිවිරුම හා භාරවීම

2.11 මුආමලාත් පිළිබඳ විස්තර :
+ ඉපයීමේ වැදගත්කම
+ ප්‍රධාන ගණුදෙනු (වෙළඳාම)
+ අනිකුත් ගණුදෙනු (උදා. : තාවකාලිකව ඉල්ලා ගැනීම බදු, ගැනීම
+ වක්පු, වසීය්යත්, වරාසත්, (පොදු දේපල, බුදල් දේපල, පරම)

2.12 ඉස්ලාම්හි ස්ත්‍රී පුරුෂ තත්වයන් :
+ නිකාහයේ විධි හා ප්‍රයෝජන
+ පවුල් ජීවිතය
+ අඹුසැමියන්
+ දෙමාපිය, දූදරු අයිතිවාසිකම් හා යුතුකම් තලාක් හා ඉද්දා

2.13 ජිනායත් :
+ හුදූද්, කියාස්, තඃසීර්

*තුන්වන ප්‍රශ්න පත්‍රය :*

3. සීරා හා තාරිකු :

3.1 ඉස්ලාමයට පෙර වූ අරාබි රටේ සමාජ ආගමික තත්වයන්

3.1.1 නබි(සල්) තුමා
+ නුබුව්වතයට පෙර ජීවිතය
  + පවුල, පරම්පරාව
  + තරුණ විය
  + උතුම් ගුණාංග
  + විවාහය
+ නුබුව්වත් හා හිජ්රත් අතර ජීවිතය
  + නුබුව්වත් ලැබීම
  + ඉස්ලාමික ප්‍රචාරයන් හා එහි ප්‍රතිඵල
  + මිඃරාජ්
  + හිජ්රත්
+ මදීනා ජීවිතය
  + සමාජ දේශපාලන ක්‍රියාකාරකම්
  + ආත්මාරක්ෂා යුද්ධයන් හා සාම ගිවිසුම්
  + ඉස්ලාම් සම්පූර්ණවීම
  + සහාබාවරුන්ගේ තත්වයන් හා ඉස්ලාමය වෙනුවෙන් එතුමන්ලාගේ දායකත්වයන්
  + කුලපාඋර්රා සීදුන් යන අයගේ ඉතිහාසය හා දේශපාලන දායකත්වයන්
  + උමය්යා අබ්බාසිය්යා පාලනකාලය
  + බයිතුල් මුකද්දසයේ ඉතිහාසය
  + ශ්‍රී ලංකා මුස්ලිම්වරුන්ගේ ඉතිහාසය හා දායකත්වය

+ මුස්ලිම්වරුන්ගේ අධ්‍යාපන දායකත්වය
+ පහත සඳහන් අය පිළිබඳ ඉතිහාසය
    + ඉමාම් බුහාරි (රහ්)
    + ඉමාම් ෂාපිඊ (රහ්)
    + ඉමාම් ගස්සාලි (රහ්)
    + ඉමාම් අබ්දුල් කාදර් ජීලාන් (රහ්)
    + ඉමාම් ෂාදුලි (රහ්)

හතරවන ප්‍රශ්න පත්‍රය :

4. අක්ලාක් - (ඉස්ලාම් සාරධර්මය)

4.1 අක්ලාක් පිළිබඳ ඉස්ලාමයේ අවධානය :
+ අක්ලාක් පිළිබඳ විස්තර
+ ඊමාන් අක්ලා අතර පවතින සම්බන්ධතාවය
+ අක්ලා හා ඉබාදත් අතර තිබෙන සම්බන්ධතාවය
+ හෘද පවිත්‍රත්වය (ඉක්ලාස්)

4.2 තක්වා :
+ වරඋසුහ්ද්
+ මුරාකබා, මුහාසපා
+ ෂමුක් (දේවකරුණාව)

4.3 දන්දීම :
+ කැපවීම
+ කෘතඥභාවය
+ ඉවසීම, හික්මීම, ඉඩදීම, සමාවීම
+ බැගෑපත්වීම
+ කාලය අගය කිරීම
+ අවයවයන් රැකගැනීම කට, ඇස, කණ, ලිංගික අංගයන්
+ අන් අයට ගෞරව කිරීම
+ යුක්තිය හා අවංකභාවය
+ තරුණ තරුණියන් අතර දක්නට ලැබිය යුතු වැදගත් සදාචාර ගුණාංගයන්
+ අනිකුත් ආගමික අය අතර වූ සහජීවනය

4.4 ඉස්ලාම් නීති පද්ධතිය :

ඇමුණුම 02

අදාළ දිස්ත්‍රික්කවල විභාග මධ්‍යස්ථාන පිහිටුවීමට බලාපොරොත්තුවන නගර හා නගර අංක

| නගරය | නගර අංකය | දිස්ත්‍රික් අංකය |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කය : | | 01 |
| මැද කොළඹ | 01 | |
| බම්බලපිටිය | 02 | |
| කළුතර දිස්ත්‍රික්කය : | | 03 |
| පානදුර | 07 | |
| කළුතර | 08 | |
| අලුත්ගම | 09 | |
| මාතර දිස්ත්‍රික්කය : | | 05 |
| වැලිගම | 11 | |
| මාතර | 12 | |
| කෑගල්ල දිස්ත්‍රික්කය : | | 07 |
| මාවනැල්ල | 14 | |
| වරකාපොල | 15 | |
| කන්නත්තොට | 16 | |
| පුත්තලම දිස්ත්‍රික්කය : | | 09 |
| නොරොච්චෝලෙයි | 21 | |
| පුත්තලම | 22 | |
| හලාවත | 23 | |
| පොළොන්නරුව දිස්ත්‍රික්කය : | | 11 |
| කඳුරුවෙල | 27 | |
| මහනුවර දිස්ත්‍රික්කය : | | 13 |
| මහනුවර | 29 | |
| නාවලපිටිය | 30 | |
| දෙල්තොට | 31 | |
| ගෙලිඔය | 32 | |
| රත්නපුර දිස්ත්‍රික්කය : | | 15 |
| ඇහැලියගොඩ | 34 | |
| බලංගොඩ | 35 | |
| ගම්පහ දිස්ත්‍රික්කය : | | 02 |
| තිහාරිය | 03 | |
| මාබෝල | 04 | |
| මල්වාන | 05 | |
| මීගමුව | 06 | |
| කල්එළිය | 54 | |
| ගාල්ල දිස්ත්‍රික්කය : | | 04 |
| ගාල්ල | 10 | |
| හම්බන්තොට දිස්ත්‍රික්කය : | | 06 |
| හම්බන්තොට | 13 | |
| කුරුණෑගල දිස්ත්‍රික්කය : | | 08 |
| කුලියාපිටිය | 17 | |
| කුරුණෑගල | 18 | |
| මැල්සිරිපුර | 19 | |
| පොල්ගහවෙල | 20 | |
| කැකුණගොල්ල | 55 | |
| අනුරාධපුර දිස්ත්‍රික්කය : | | 10 |
| අනුරාධපුර | 24 | |
| කැකිරාව | 25 | |
| ගලෙන්බිඳුනුවැව | 26 | |

| නගරය | නගර අංකය | දිස්ත්‍රික් අංකය |
|---|---|---|
| මාතලේ දිස්ත්‍රික්කය : | | 12 |
| මාතලේ | 28 | |
| නුවරඑළිය දිස්ත්‍රික්කය : | | 14 |
| නුවරඑළිය | 33 | |
| බදුල්ල දිස්ත්‍රික්කය : | | 16 |
| බදුල්ල | 36 | |
| වැලිමඩ | 37 | |
| මොණරාගල දිස්ත්‍රික්කය : | | 17 |
| බිබිල | 38 | |
| මඩකලපුව දිස්ත්‍රික්කය : | | 19 |
| කාත්තාන්කුඩි | 43 | |
| එරාවූර් | 44 | |
| වාලච්චේන | 45 | |
| වවුනියාව දිස්ත්‍රික්කය : | | 21 |
| වවුනියාව | 49 | |
| මුලතිවු දිස්ත්‍රික්කය : | | 23 |
| මුලතිවු | 51 | |
| යාපනය දිස්ත්‍රික්කය : | | 25 |
| යාපනය | 53 | |
| අම්පාර දිස්ත්‍රික්කය : | | 18 |
| අක්කරෙයිපත්තුව | 39 | |
| පොතුවිල් | 40 | |
| කල්මුනේ | 41 | |
| සමන්තුරේ | 42 | |
| ඉරක්කාමම් | 56 | |
| නින්දවූර් | 57 | |
| ඔලුවිල් | 58 | |
| ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය : | | 20 |
| මුතූර් | 46 | |
| කින්නියා | 47 | |
| ත්‍රිකුණාමලය | 48 | |
| මන්නාරම දිස්ත්‍රික්කය : | | 22 |
| මන්නාරම | 50 | |
| කිලිනොච්චි දිස්ත්‍රික්කය : | | 24 |
| කිලිනොච්චි | 52 | |

ඇමුණුම් - 03

**විභාගය සඳහා වූ විෂයයන් හා විෂය නිර්දේශය**

(2004 වසරේ සිට පැවැත්වෙන විභාගවලට අදාළ)

මෙකී විභාගයේ සෑම ප්‍රශ්න පත්‍රයක්ම පැය තුනක කාලයක ප්‍රශ්න පත්‍ර වන අතර එවැනි ප්‍රශ්න පත්‍ර හතරකින් යුක්තය.

I පළමුවන ප්‍රශ්න පත්‍රය - අකීදා හා ෂරීආ (ඉස්ලාම් සිද්ධාන්ත හා ක්‍රියාදාමයන් මූලිකාංග) හා අරාබි භාෂාව.

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් යුක්තය.

I වන කොටස - වාස්තවික (Objective Type) ප්‍රශ්න (ලකුණු 20යි)

ඉස්ලාම් මූලික සිද්ධාන්ත, ප්‍රධාන මූලිකාංග හා නෛතික මූලධර්මයන් හඳුනා ගැනීම.

අ. අර්කානුල් ඊමාන්
ආ. අකීදාවේ කොටස්
ඉ. අල්කුරාණය
ඊ. අල් හදීසය

මෙම කොටසට අයත් සියලුම ප්‍රශ්න වලට උත්තර සැපයිය යුතුවේ.

II අ. කෙටි උත්තර සැපයීම - ප්‍රශ්න දහයක් (ලකුණු 10යි)
ආ. බහුවරණ ප්‍රශ්න - ප්‍රශ්න පහක් (ලකුණු 05 යි)
ඇ. හිස්තැන්පිරවීම - ප්‍රශ්න පහක් (ලකුණු 05යි)

II වන කොටස - ව්‍යුහගත ප්‍රශ්න (ලකුණු 40යි)

තව්හිද්හා එයට විරුද්ධ කරුණු උපමූලාංගයන් පැහැදිලිව විස්තර කිරීම.

අ. තව්හීදි හා එහි වර්ගයන්
ආ. තව්හීදියට ප්‍රතිවිරුද්ධ ප්‍රතිපත්ති
ඇ. ඉජ්මාඋ හා කියාස්
ඈ. ඉජ්තිහාද් සහ මුජ්තහීද්වරු

මෙම කොටසට අයත් ප්‍රශ්න හතරකින් කැමති ප්‍රශ්න දෙකකට උත්තර සැපයිය යුතුය. සෑම ප්‍රශ්නයකම අ, ආ, ඇ, ඈ යන ප්‍රශ්න කොටස් හතරක් ඇත. එහි එක් කොටසක ප්‍රශ්නයකට ලකුණු 05 බැගින් (4 x 5 =20) ලකුණු දෙනු ලැබේ.

III වැනි කොටස - රචනාත්මක (ලකුණු 40යි)

නෛතික මූලධර්මවල ප්‍රායෝගිකත්වය හා ඒවා පිළිපැදීම :

(අ) අල්කුරාන් අල්හදීස් ඉතිහාසය
(ආ) අල්කුරානයේ ප්‍රධාන සූරා හා සූරාවට අදාල අරාබි වචන අරාබි භාෂාවෙන් ලිවීම
(ඇ) ප්‍රධාන මද්හබ් සතර හා ඒවායේ ඉමාම්වරුන්
(ඈ) ඉජ්තිහාද් හා අතිකුත් මුජ්තහිද්වරුන්

මෙම කොටසේ දෙනු ලබන ප්‍රශ්න හතරින් කැමති ප්‍රශ්න දෙකකට උත්තර සැපයිය යුතුය. සෑම ප්‍රශ්නයක්ම දැනුම, කුසලතාව, ආකල්ප පිළිබඳව ඇගයීම් කළහැකි ආකාරයේ රචනාමය පිළිතුරු දිය යුතු ප්‍රශ්න වේ. එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් ලබාදිය හැක.

2 දෙවැනි ප්‍රශ්න පත්‍රය - අල්පික්හුල් ඉස්ලාම් (ඉස්ලාමීය නීති මාලාව)

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් යුක්තය.

I කොටස - වාස්තවික ප්‍රශ්න 40 (Objective Type 40) (ලකුණු 20යි)

පංචමහ යුතුකම් සහ අනිකුත් එදිනෙදා කටයුතු ඉබාදත් වශයෙන් යොදා ගැනීම. :

(අ) තහාරත් හා නජීසය
(ආ) පංච මහ යුතුකම්
(ඇ) අනිකුත් ඉබාදත්

මෙම කොටසට අයත් සියලු ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුය.

| | | | |
|---|---|---|---|
| I (අ) | පොදු උත්තර සැපයීම | - ප්‍රශ්න දහයයි | (ලකුණු 10 යි) |
| (ආ) | බහුවරණ ප්‍රශ්න | - ප්‍රශ්න පහයි | (ලකුණු 05යි) |
| (ඇ) | හිස්තැන් පිරවීම | - ප්‍රශ්න පහයි | (ලකුණු 05යි) |

II වැනි කොටස - ව්‍යුහගත ප්‍රශ්න (ලකුණු 40යි)

මුආමලාත්, මුනාකබාත්, ජිනායාත් ආදී ක්‍රියාකාරකම් ඉබාදත් කර ගැනීම

(අ) පංචමහ යුතුකම්
(ආ) අනිකුත් සුන්නත් ඉබාදත්
(ඇ) විවාහ හා පවුල් ජීවිතය
(ඈ) මුආමලාත්
(ඉ) ජිනායාත්

මෙම කොටසේ ඇති ප්‍රශ්න හතරෙන් කැමති ප්‍රශ්න දෙකකට පිළිතුරු සැපයිය යුතුවේ. සෑම ප්‍රශ්නයකම අ, ආ, ඇ, ඈ යන ප්‍රශ්න කොටස් හතරක් ඇත. එක් ප්‍රශ්න කොටසකට ලකුණු 05 බැගින් (4 x 5 =20) ලකුණු දෙනු ලැබේ.

III වැනි කොටස - රචනාගත ප්‍රශ්න (ලකුණු 40යි)

පර්ලු, සුන්නත්, ඉබාදත් වල ප්‍රයෝජනයන් හා දර්ශනයන් දැනගෙන ක්‍රියාකිරීම :

(අ) පංචමහ යුතුකම්
(ආ) වෘතිමය කටයුතු
(ඇ) වැරදි හා දඬුවම්
(ඈ) විවාහය හා පවුල් ජීවිතය

මෙම කොටසේ දෙනු ලබන ප්‍රශ්න හතරෙන් කැමති ප්‍රශ්න දෙකකට පිළිතුරු සැපයිය යුතුය. සෑම ප්‍රශ්නයකටම දැනුම, කුසලතා, ආකල්ප අගැයීමට ලක් කළ හැකි රචනාත්මක පිළිතුරු සැපයිය යුතුය. එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් දෙනු ලැබේ.

3 වැනි ප්‍රශ්න පත්‍රය - සීරා හාතාරික්කු

නබි (සල්) තුමාගේ ඉතිහාසය හා අනිකුත් ඉතිහාස

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් යුක්තය.

I කොටස - වාස්තවික ප්‍රශ්න (ලකුණු 20යි)

නබි (සල්) තුමාගේ හා සහබාවරුන්ගේ හා අනිකුත් ඉතිහාස දැනගැනීම
(අ) ජාහිලියා කාලයේ ආගමික සමාජ තත්ත්වය
(ආ) නබි (සල්) තුමාගේ ජීවිත ඉතිහාසය
(ඇ) සහාබාවරුන් ඉස්ලාමයට කල දායකත්වය
(ඈ) උමයියා අබ්බාසියා කාලයන්

මෙම කොටසේ ප්‍රශ්නවලට සියලුම විභාග අයැදුම්කරුවන් පිළිතුරු සැපයීම අවශ්‍යය. මෙම ප්‍රශ්නය කොටස් තුනකින් යුක්තය.

I කොටස

(අ) කෙටි උත්තර සැපයීම - ප්‍රශ්න දහයයි (ලකුණු 10යි)
(ආ) බහුවරණ - ප්‍රශ්න පහයි (ලකුණු 05යි)
(ඇ) හිස්තැන් පිරවීම - ප්‍රශ්න පහයි (ලකුණු 05යි)

සම්පූර්ණ ලකුණු 20යි)

II වැනි කොටස - ව්‍යුහගත ප්‍රශ්න (ලකුණු 40යි)

(අ) නබි (සල්) තුමාගේ මක්කා ජීවිතය
(ආ) නබි (සල්) තුමාගේ මදීනා ජීවිතය
(ඇ) කුලපාඋර්රාසිදූරන්වරුන්ගේ ඉතිහාසය
(ඈ) විවිධ ගෝත්‍රවලට අයත් ඉමාම්වරුන්ගේ දායකත්වයන්
(ඉ) බයිතුල් මුකද්දාස්

මෙම කොටසේ දෙනු ලබන ප්‍රශ්න හතරෙන් කිසියම් ප්‍රශ්න දෙකකට පිළිතුරු සැපයිය යුතු වේ. සෑම ප්‍රශ්නයකම අ, ආ, ඇ, ඈ යන ප්‍රශ්න කොටස් හතරක් ඇත. එක් ප්‍රශ්න කොටසකට ලකුණු 05 බැගින් දෙනු ලැබේ. (5x4=20)

III වැනි කොටස - රචනාගත ප්‍රශ්න (ලකුණු 40යි)

නබි (සල්) තුමා විසින් පෙන්වා දෙන ලද ඉස්ලාම් සමාජීය, දේශපාලන අවශ්‍යතාවන් ගැන අවබෝධ කිරීම :

(අ) නබි (සල්) තුමාගේ ජීවිත ඉතිහාසය
(ආ) අල්කුල පා උර්රාෂිදූන්වරුන්ගේ දේශපාලන දායකත්වය
(ඇ) ශ්‍රී ලංකා මුස්ලිම්වරුන්ගේ ඉතිහාසය හා කැපවීම
(ඈ) මුස්ලිම්වරුන්ගේ අධ්‍යාපනික දායකත්වය

මෙම කොටසට අයත් ප්‍රශ්න හතරෙන් යම්කිසි ප්‍රශ්න දෙකකට පිළිතුරු සැපයිය යුතුවේ. ලකුණු 20ක් බැගින් දෙනු ලැබේ.

(මුළු ලකුණු 5 x 20 = 100)

4 වැනි ප්‍රශ්න පත්‍රය — අල්-අක්ලාක්

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් 03කින් යුක්තය.

I වැනි කොටස - වාස්තවික ප්‍රශ්න (ලකුණු 20)

(අ) සාරධර්ම පිළිබඳ ඉස්ලාමීය දැක්ම
(ආ) තක්වා
(ඇ) පුණ්‍ය කර්ම
(ඈ) ආදීල්

මෙම කොටසේ ප්‍රශ්න හතරටම පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 05 බැගින් මෙම කොටසට ලකුණු 20ක් හිමිවේ.

II වැනි කොටස - ව්‍යුහගත ප්‍රශ්න (ලකුණු 40)

* අක්ලාක් සහ ඊමානය
* මුරාකබා සහ වරද
* සමාජීය සම්බන්ධතා පිළිබඳ සාරධර්ම
* කාල කළමනාකරණය සංවේදන පාලනය කිරීම

මෙම කොටසේ ප්‍රශ්නවලින් දෙකකට පිළිතුරු ලිවිය යුතුය. සෑම ප්‍රශ්නයක්ම අ, ආ, ඇ, ඈ යනුවෙන් කොටස් කර ඇත. එක් ප්‍රශ්නයකට 5 x 4 = 20 වශයෙන් ලකුණු පිරිනැමේ.

III වැනි කොටස - රචනාමය ප්‍රශ්න (ලකුණු 40යි)

* ඉස්ලාමීය සාරධර්ම තුළින් ආදරය, කරුණාව යන මානුෂික ගුණධර්ම වර්ධනය
* ඉබාදත් මගින් යහපත් සංකල්ප ප්‍රදර්ශනය වීම
* ජීවීන්ට කරුණාව දැක්වීම
* ඉස්ලාමීය නීති
* තරුණ පරපුරේ තිබිය යුතු යහපත් ගතිගුණ

මෙම කොටසේ ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු ලිවිය යුතුය. එක් එක් පිළිතුරකට ලකුණු 20 බැගින් ලකුණු 40ක් පිරිනැමේ.

12-883

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.